**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව - සති පාසල**

**01. ශ්‍රේණිය : 11** **විෂයය: ගෘහ ආර්ථික විද්‍යාව** **සතිය : 01**

**02. පාඩම හෝ ඒකකය: 1 ගෘහ අභ්‍යන්තරය හා ගෙවත්ත අලංකරණය කිරීම**

**03. මෙම පාඩම තුලින් ලබා ගත හැකි ඉගෙනුම් එල:**

- ගෘහ අලංකරණය සඳහා උපයෝගී වන කලා මූලිකාංග නිරීක්ෂණය කර ඒවා සඳහන් කරයි.
- එම කලා මූලිකාංග අලංකරණයට යොදා ගන්නා ආකාරය විස්තර කරයි.
- ගෘහයේ විවිධ ස්ථාන සඳහා අදාල ලෙස ගෘහ කලා මූලිකාංග භාවිත කරමින් ප්‍රසන්න ජීවන පරිසරයක් ගොඩ නගයි.

04. ශිෂ්‍යයා කල යුතු කාර්යයන්:

I. ගෘහ ආර්ථික විද්‍යාව පෙළ පොතේ පළමුවන පාඩමෙහි කලා මූලිකාංග පාඩම කියවා හොඳින් තේරුම් ගන්න.
II. නිර්මාණයක් ගොඩ නැගීමේදී අත්‍යවශ්‍ය වන කලා මූලිකාංග සඳහන් කරන්න.
III. ඔබේ නිවාස තුල ඉහත සඳහන් කල කලා මූලිකාංග යොදාගෙන ඇති ස්ථාන/ උපාංග / නිර්මාණ/ ගෘහ භාණ්ඩ වගු ගත කරන්න.

| කලා මූලිකාංගය | ස්ථාන/ උපාංග / නිර්මාණ/ ගෘහ භාණ්ඩ | යොද ඇති ආකාරය |
|---|---|---|
| උදා: රේඛා : සිරස් රේඛා | ජනේලය | ජනේලයේ ඉහල සිට පහලට ජනෙල් කුරු ලෙස |

IV. ඔබ හඳුනා ගත් කලා මූලිකාංග අනුගමනය කරමින් , නිවසේදී භාවිතා කල හැකි විවිධ අමුද්‍රව්‍ය භාවිතයෙන් බිත්ති සැරසිල්ලක්/ මල් සැකසුමක්/ නිර්මාණය කරන්න.
V. ඒ සඳහා කලා මූලිකාංග භාවිත කරන ආකාරය “ දල සැලැස්මක්” මගින් සැලසුම් කරන්න.
දල සැලැස්ම හා නිර්මාණය කල උපාංගය නිවසේ වැඩිහිටියන්ට/ ගුරුතුමියට ඉදිරිපත් කරන්න.

05. ඉහත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය තොරතුරු තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා අන්තර්ජාලය හා සම්බන්ධ වන්න.

- https://www.canva.com/colors
- https://www.google.lk/search?q=wall+decoration+ideas&sxsrf
- https://www.google.lk/search?q=flower+arrangements+ideas&sxsrf

වෙනත් ඉගෙනුම් ආධාරක : තරුණි, රජින, සිරිකත වැනි පුවත්පත් මගින්

06. ඇගයීම / තක්සේරුකරණ ක්‍රමවේදය:

I. නිර්මාණය කරන ලද උපාංගය නම් කරන්න. ලකුණු 05
II. එහි දල සැලසුම සඳහා යොදා ගත් පහත සඳහන් කරුණු පැහැදිලි කරන්න.
a) හැඩය
b) රේඛාමය පෙනුම/ රේඛා වර්ග
c) විවිධ වයනයන්
d) වර්ණවල ස්වාභාවය

e) උපාංගය තබන ස්ථානයට යෝග්‍ය වීමට හේතු ලකුණු 10

III. භාවිත කල අමුද්‍රව්‍ය ලකුණු 05

IV. නිර්මාණය සිදු කර තම වැඩිහිටියන්ට පෙන්වා සාකච්ඡා කර යෝග්‍ය ස්ථානයේ අලංකාරය සඳහා තබන්න.
නැතහොත් ගුරුතුමියට ඉදිරිපත් කරන්න,/ whatsup කරන්න. ලකුණු 10

V. ඔබේ නිවසේ විවිධ කොටස් අලංකාර හා ප්‍රසන්න පරිසරයක් ලෙස සකස් කිරීමට අවශ්‍ය යෝජනා වැඩිහිටියන් සමග සාකච්ඡා කර ඉදිරිපත් කරන්න. ලකුණු 10